# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1716/29 - 2011 ජූලි 29 වැනි සිකුරාදා - 2011.07.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

**2010 අංක 10 දරන බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන් වෙත රාජකාරි සඳහා නිවාස හා ජංගම දුරකථන පහසුකම් ලබා දීම සඳහා වන ප්‍රඥප්තිය**

2010 අංක 10 දරන බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන් වෙත රාජකාරි සඳහා නිවාස හා ජංගම දුරකථන පහසුකම් ලබා දීම සඳහා වන ප්‍රඥප්තිය 2010 නොවැම්බර් මස 23 වන දින පැවති බස්නාහිර පළාත් සභා රැස්වීමේ දී සම්මත කරන ලදුව 2011 මාර්තු මස 21 දින බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර එස්. අලෙවි මව්ලානා මැතිතුමා විසින් අනුඥාව ලබා දී ඇති බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන,<br>
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,<br>
විදුලිබල හා බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

2011 ජූලි මස 25 වැනි දින,<br>
කොළඹ 07,<br>
ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,<br>
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

**බස්නාහිර පළාත**

***2010 අංක 10 දරන බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන් ගේ රාජකාරි සඳහා නිවාස හා ජංගම දුරකථන පහසුකම් ලබා දීම සඳහා වන ප්‍රඥප්තිය***

බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන්ගේ රාජකාරි සඳහා නිවාස හා ජංගම දුරකථන පහසුකම් ලබාදීම සඳහා විධිවිධාන සළසනු පිණිස වූ ප්‍රඥප්තියකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව මෙසේ පනවනු ලැබේ. :–

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2010 අංක 10 දරන බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා සභිකවරුන් වෙත රාජකාරි සඳහා නිවාස හා ජංගම දුරකථන පහසුකම් ලබාදීම සඳහා වන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයා විසින් අත්සන් තබන දිනෙන් පසුව එළඹෙන ලිත් වර්ෂයේ ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන්නේය. (ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය)

අරමුණු හා කාර්යය

2. ප්‍රාදේශීය සභාවක් විසින් ප්‍රාදේශීය සභාව සඳහා තේරී පත්වන සභිකවරුන්ගේ රාජකාරි සඳහා නිවාස හා ජංගම දුරකථන පහසුකම් ලබාදීම හා නඩත්තු කිරීම පිණිස ප්‍රාදේශීය සභා අරමුදලින් වියදම් දැරීම නීත්‍යානුකූල වන්නේය.

3. ප්‍රාදේශීය සභා සභිකවරුන්ගේ රාජකාරි සඳහා නිවාස හා ජංගම දුරකථන බිල්පත් පියවීම වෙනුවෙන් වන වියදම් උපරිමයන් අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රීති මගින් නියම කරන ප්‍රමාණයන් විය යුතුය.

4. මෙම ප්‍රඥප්තිය යටතේ කාර්ය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකිය.

5. (i) අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එසේ පළ කිරීමෙන් පසුව හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

(ii) අමාත්‍යවරයා විසින් සාදනු සෑම රීතියක්ම පළාත් සභාව විසින් අනුමත කිරීමෙන් අනතුරුව එය ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු අතර, එකී අනුමත කරන ලද නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින, සිට බලාත්මක වන්නේය.

අර්ථ නිරූපනය

6 පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියේ "අමාත්‍යවරයා" යන්නෙන් "බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා" අදහස් වන්නේය.

08-368

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.